Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව**

**ශ්‍රේණිය 12** | **විෂය නර්තනය** | දෙවන වාරය **B** -2

**නිපුණතාව 01 :** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3** : සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි.

**ක්‍රියාකාරකම 1.3** : ගණපති වන්නම් නර්තනය කරමු.

**ඉගෙනුම් පල :**

- අදාළ වන්නම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ගණපති වන්නමට අදාල තාල රූපය නම් කරයි.
- මුසලඩි වන්නමට අයත් පද තාල තබමින් කියයි.
- තානම හා කවි ගායනයට අදාළ ව හස්ත චලන නිවැරදි ව ප්‍රදර්ශනය කරයි.
- වන්නමට අදාළ පද, කස්තිරම්, සීරුමාරු, අඩව් නියමිත අංගහාර අනුව නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව උගත් පද කොටස් නර්තනය කරයි.
- ගායනය කරමින් බෙර වාදනය අනුව වන්නම් ඉදිරිපත් කරයි.
- උගත් වන්නම් සාමූහික ව හා ඒකල ව ප්‍රදර්ශනය කරයි.

**ශිෂයා කල යුතු කාර්යයන් -**

- මෙතෙක් උගත් වන්නම් අනුව මෙම වන්නම නර්තනය කිරීමට උත්සහ ගන්න.
- අන්තර් ජාලය තුලින් හෝ හඩ පටයක් තුලින් මුසලඩි වන්නම හොඳින් ශ්‍රවනය කරන්න.ඒ අනුව ගායනය කරමින් මීට පෙර උගත් අලංකාර මාත්‍රා වන්නම් නර්තනය සඳහා යොද ගන්න.
- අන්තර්ජාලය තුලින් නරඹන ලද වන්නමට අනුව ගණපති වන්නම සම්පූරණයෙන්ම නර්තනය කිරීම සඳහා උත්සහ ගන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක**

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය

ඇගයීම්

- අදාළ වන්නමෙහි තාල රූපය නම් කරන්න.
- තාල තබමින් වන්නම ගායනය කරන්න.
- බෙර වාදනයට අනුව වන්නම නර්තනය ඉදිරිපත් කරන්න.

**පහත සඳහන් ඇගයීම් ද සිදු කරන්න.**

- සති පාසල් කාර්‍ය පත්‍රිකා - 12 නර්තනය දෙවන වාරය A - 02

<u>පසු ක්‍රියාකාරකම්</u>

- සාම්ප්‍රදායිකව ඉගෙන ගත් ගණපති වන්නම නිර්මානශීලීව ගායනා කරමින් නිර්මානශීලීව නර්තනය කරන්න.
- ගුරුවරයාගේද සහය ලබාගෙන එය ප්‍රාසංගික නිර්මාණයක් බවට පත් කර ගන්න.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය . රත්නපුර කලාපය .**